# පශ්චාත් යුද ගැටුම් සාදයට සපත්තුවකින් ගැසීම

මේ දවස්වල ලංකාවේ වාම ලිබරල්වාදී සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී යැයි සැළකෙන බුද්ධිමතුන් බහුතරයකගේ සිත ගිය විනෝදාංශයක් තිබේ. ඒ 'පශ්චාත් යුද ගැටුම්' විවරණ සම්පාදනයයි. ඒ යටතේ තොරොම්බල් කෙරෙන සාකච්ඡාමය තේමා ඕනෑ තරම් ය. 'පශ්චාත් කොටි සංවිධාන අවදිය තුළ දේශපාලනය' ඉන් එකකි. 'පශ්චාත් ඊළම්වාදී දෙමළ ජාතිකවාදය' තවත් එකකි. 'පශ්චාත් යුද කාලීන ජන වාර්ගික සම්බන්ධතා සහ රාජ්‍ය ප්‍රතිසංස්කරණ' ගැනද ඇතැම්හු අදහස් පළ කරති. බැලූ බැල්මට මේ 'පශ්චාත් යුද ගැටුම් විවරණයන්' විසින් පෙන්නුම් කරන්නේ යට කී ශාස්ත්‍රාලයීය බුද්ධිමතුන් තුළ ඇවිළෙන ප්‍රජාතාන්ත්‍රික උද්වේගය සහ සාමාජීය අනුරාගයයි. යුද සංත්‍රාසයෙන් මුසපත් වූ රටක් තුළ ඉතිරිවන දේශපාලන ව්‍යාකූලත්වයට සහ සාමාජීය වික්ෂිප්තභාවයට මෙම උද්‍යෝගීමත් සාකච්ඡා මගින් පිළිතුරු සැපයෙතැයි අපේක්ෂා කෙරේ.

නමුත් මේ 'වැදගත් ප්‍රජාතාන්ත්‍රික සාකච්ඡාවන්ගේ' අරටුවෙහිම පරහක් තිබේ. මේ සාකච්ඡාවන් සඳහා පරිකල්පනය කොටගත් සංකල්පීය මායිම්වලින් ඔබ්බෙහි දවැන්ත යුද්ධයක් ඇවිළ යයි. රජයේ හමුදාවෝ දෙමළ ගරිල්ලන්ගේ පාලනයට යටත්ව තිබූ භූමිය කිලෝ මීටරයෙන් කිලෝ මීටරය විනිවිදිති. ඒ මඟ අවුරා දෑමෙන නිශ්චල සහ චංචල සෑම වස්තුවක්ම විසි හතර පැය මුළුල්ලේ එල්ල කෙරෙන බර අවි සහ ගුවන් ප්‍රහාර විසින් විසුණු කොට දැමෙයි. යුද්ධය ඇවිළ යන භූමියේ 250,000කට වැඩි සිවිල් ජනගහණයක් අවතැන්ව හිඳියි. ආහාර සහ ඖෂධ හිඟයන්ද, ඉහළ යන මරණ සංඛ්‍යාවන් සහ තුවාලකරුවන්ගේ සංඛ්‍යාවන්ද පිළිබඳ වාර්තා දෛනිකව ගලා එයි. තාවකාලික රෝහල් සහ ප්‍රකාශයට පත්කොට ඇති ආරක්ෂක කලාපයන් තුළදීම පෙර නොවූ විරූ තරමින් සිවිල් ජනයා මිය යති. යුද කලාපයෙන් රජයේ පාලන ප්‍රදේශ කරා ආ ජනයා කටු කම්බියෙන් වටකොට හමුදා රැකවල් යෙදූ රැඳවුම් කඳවුරු තුළ නිදහස් යාම් - ඊම් තහනම් කොට ගාල් කෙරේ. අත් අඩංගුවට ගැනීම්, පැහැරගෙන යාම්, ලිංගික බලහත්කාරයන්, අතුරුදහන්වීම් සහ ඝාතනයන් රජයේ පාලන ප්‍රදේශ තුළ නිර්බාධිතව සිදු වෙමින් පවතින අතර ජනමාධ්‍යකරුවන් ඝාතනය හා පැහැරගෙන යාමත්, මානව හිමිකම් හා වෘත්තීය සමිති ක්‍රියාකාරීන් ඇතුළු ආණ්ඩු විපාක්ෂිකයින් බිය වැද්දීමත් අඛණ්ඩව සිදු කෙරේ.

'පශ්චාත් යුද ගැටුම්' ගැන සන්සුන් ශාස්ත්‍රාලයීය සාකච්ඡාවන් කෙරෙන්නේ මේ ලේ වැකි ප්‍රචණ්ඩ වා සුළිය හරි මැද සිට ය. නමුත් ඒ සාකච්ඡාවන් මගින් පොරබදන බව පැවසෙන 'ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ගැඹුරු ගැටළුව' ඉහතින් කී යථාර්ථයන් සංයුක්ත කර නොගනී. සමකාලීන ලේ වැකි ව්‍යාකූලත්වයට ඔබ්බෙහි ඇති පරිකල්පිත අනාගත සන්දර්භයක් තුළ ඒ සාකච්ඡාවන් ස්ථානගත කොට තිබේ. ඒ සන්දර්භය තුළ යුද්ධය වනාහී වැඩ නිම වූ අතීත ව්‍යාපෘතියකි. කොටි සංවිධානය වනාහී ඉතිහාස පුරාවෘත්තයකි. ගුවන් සහ බර අවි ප්‍රහාරවලට හසුව බුරුතු පිටින් මිය යන හා ආබාධිතභාවයට පත් වන සිවිල් ජනයාගේ සාමූහික ප්‍රජාතාන්ත්‍රික අයිතීන් පිළිබඳ ගැටළුව ඒ සාකච්ඡාවන් තුළ අභිමුඛ නොවේ. රජයේ පාලන ප්‍රදේශ තුළ අලුතින් ඉදි කළ අවතැන්වූවන්ගේ සිර කඳවුරු තුළ විසුරුවා හැර ගාල් කොට දැමූ සරණාගත ජනයා ඒ සන්දර්භයේදී මුණ නොගැසේ. අත් අඩංගුවට ගනු ලබන, පැහැරගෙන යනු ලබන, වධ බන්ධනයන්ට හා අතවරයට ලක් කෙරෙන, අතුරුදහන් වන, ඝාතනය වන ජන සමූහයකගේ මූලික ප්‍රජාතාන්ත්‍රික අයිතීන් මුහුණ දී ඇති ඉරණමින් ඒ සාකච්ඡාවන්ට බාධා එල්ල නොවේ. පශ්චාත් යුද ගැටුම් පිළිබඳ ඒ සන්දර්භය මේ සියලු ලේ වැකි රාජකාරී හමාර කළ පසු බිහිවීමට නියමිත මුත්, දැනට පරිකල්පිත එකකි.

සන්සුන් විවේකී සුවය එහෙයිනි.

### වර්ග සංහාරයක් ගැන මා කී බොරුව

අපි නිදසුනක් සළකා බලමු.

'වර්ග සංහාරයක්' පිළිබඳ මා විසින් පෙබරවාරි 08 වෙනිදා 'රාවය' පත්‍රයට ලියූ 'සමකය' සටහන පිළිබඳ ආචාර්ය සුමනසිරි ලියනගේ සිය තීරු ලිපියෙන් අදහසක් පළ කොට තිබිණ. ඒ පෙබරවාරි 15 වෙනිදා ය. ඔහු මෙසේ ලියයිඃ

'රජය සහ ආරක්ෂක හමුදා දෙමළ ජන සංහාරයක් කරන්නට සැළසුම් කරන්නේ යැයි රෝහිත භාෂණ කියන ***කතාවෙහි*** කිසිදු ***සත්‍යයක් ඇතැයි මට නොපෙනේ.*** කොටි සංවිධානයට නම් හමුදා ලවා එවන් දෙමළ ජන සංහාරයක් කරවා ගැන්මට අවශ්‍යතාවක් ඇතැයි ***මට සිතේ.*** එය ඔවුන්ට මිලිටරි උපායකි. හමුදාවනට එය මිලිටරි ගැටළුවකි.' (අවධාරණය මගෙනි.)

ඒ අනුව ආචාර්ය සුමනසිරි ලියනගේ විසින් ඉදිකොට ගත් සන්සුන් '**සමාජ ප්‍රජාතන්ත්‍ර මණ්ඩපයට**' මා කී දේ **නොපෙනේ.** ඒ වෙනුවට වෙනත් දෑ **සිතේ.** මට පෙනෙන දේ ඔහුට නොපෙනීමත්, ඔහුට සිතෙන දේ මට නොසිතීමත් අතර වෙනස සළකුණු කරන්නේ කුමක් විසින්දැයි අවශ්‍ය නම් විමසා බැලිය හැකි ය. නමුත් වැදගත් කරුණ වන්නේ මා කී දේ ආචාර්ය ලියනගේට සත්‍යයක් සේ නොපෙනෙන්නේ නම් එය අසත්‍යයක් බවට පෙරළෙන බව ය. ඒ අනුව 'බොරුවක්' බවට පෙරළීමේ ඉරණමින් මා දුටු 'ඇත්ත' ගළවාගැනීමට සටන් කිරීම මගේ කාර්යයකි. ආචාර්ය ලියනගේට 'අසත්‍යයක් සේ පෙනෙන' වර්ග සංහාරයක් පිළිබඳ මගේ '**පෙනීමට**' පිටුබල සපයන ආසන්න භෞතික සාක්ෂි මම දැන් සංක්ෂිප්තව ගොණු කරමි. ඒ කියවන්නාගේ පහසුව පිණිස ය.

තාක්ෂණික අරුතින් සළකතොත්, දැන් ඇවිළ යන යුද්ධය ප්‍රායෝගිකව මෙහෙයවනු ලබන්නේ හමුදාපති සරත් ෆොන්සේකා විසිනි. භාවිතාවට නංවා ඇති හමුදාමය ක්‍රියාන්විතයන් මගින් මුදුන්පත් කරගැනීමට අපේක්ෂිත දේශපාලන අභිලාෂයන් සංයුක්ත වන්නේද හමුදාපතිවරයා සහ අවශේෂ ආරක්ෂක ප්‍රධානීන් විසින් කරනු ලබන ප්‍රකාශ තුළ ය. හමුදාමය ක්‍රියාමාර්ග පදනම්ව ඇති දේශපාලන සිතීම පරාවර්ථනය කරනු ලබන්නේ ඔවුන්ගේ ප්‍රකාශ මගින් මිස හාර මාසයකට වතාවක් රැස්වන මහාචාර්ය තිස්ස විතාරණගේ සර්ව පාක්ෂික 'චැට් ඇන්ඩ් මියුසික්' වැඩ සටහන් මගින් නොවේ. 2008 ජූලි 19 වෙනිදා ආණ්ඩුවේ 'ඩේලි නිවුස්' පත්‍රයේ ආරක්ෂක ලියුම්කරු සමග සාකච්ඡාවකට එක්වන හමුදාපතිවරයා මෙසේ කියයිඃ ''ඕනෑම රටක පරිපාලනය හසුරුවන් ලබන්නේ බහුතර ප්‍රජාව විසිනි. ඒ තත්ත්වය අපිට වැළැක්විය නොහැකියි. සුළුතරයක් විසින් බහුරය පාලනය කරන්නේ නම් එය භයානක තත්ත්වයක් මෙන්ම ප්‍රශ්නයකි. කවර රටක් වුවද පාලනය කළ යුත්තේ බහුතරය විසිනි. ජනගහණයෙන් බහුතරය 74%ක් නියෝජනය කරනු ලබන සිංහල ප්‍රජාව විසින් මේ රට පාලනය කරනු ඇත.'' *(Daily News - 2008.07.19)* ඉන් දෙමසක් ඇවෑමෙන් කැනඩාවේ පළවන 'නැෂනල් පෝස්ට්' පත්‍රයේ සැප්තැම්බර් 23 වෙනිදා කලාපය සමග සම්මුඛ සාකච්ඡාවකට එක්වන හමුදාපති ෆොන්සේකා වැඩි දුරටත් සිය ස්ථාවරය පහදයිඃ ''මේ රට අයිති සිංහලයින්ට බව මම තරයේ විශ්වාස කරමි. නමුත් සුළුතර ජන කොටස්ද මෙහි ජීවත්වන අතර අපි ඔවුන්ට අපේම ජන කොටස් මෙන් සළකමු. රටේ 75%ක් තරමේ බහුතරයක් වන අප කිසි කලෙක යටත්

නොවන අතර රට ආරක්ෂා කිරීමේ අයිතිය අප සතුව තිබේ. ඔවුන්ට අප හා මේ රටේ ජීවත්විය හැක. නමුත් සුළුතරයක් වීම ආවරණයක් කොටගෙන නොගැළපෙන ඉල්ලීම් කිරීමට ඔවුන් උත්සාහ නොකළ යුතු ය.'' *(http://www.nationalpost.com/story.html?id=832374)*

කාරණාව පැහැදිලි ය. හමුදාමය ක්‍රියාන්විතයන් මගින් ප්‍රතිෂ්ඨාපනය කිරීමට අපේක්ෂිත දේශපාලන යථාර්ථය එයයි. ප්‍රතිශතයක් වශයෙන් සළකතොත් 99.9%ක්ම සිංහල ජනයාගෙන් සැදුම්ලත් රාජ්‍ය හමුදා, දෙමළ ජනයා පාරම්පරිකව දිවිගෙවූ භූමි භාගයන් විනිවිදින්නේ ඒ හමුදාවන්ට අණ දෙන්නා විසින් ඉහතින් නිරවුල්ව ප්‍රකාශිත දේශපාලන අභිලාෂයන් මුදුන්පත් කරගැනීමේ එල්ලය ඇතිව සකස් වූ යුදමය සැළැස්මක් යටතේ ය. ඒ සමස්ත යුද මෙහෙයුම් ප්‍රායෝගිකව අධීක්ෂණය කිරීමේ කාර්යය පැවරුණු සේනාපතිවරයා කල්පනා කරන්නේ මේ රට සිංහලයින්ගේ බව ය. සෙසු ජන කොටස් 'අපේම ජනයා' සේ සළකන නමුත් 'ඔවුන් නොගැළපෙන ඉල්ලීම් නොකළ යුතු' බව ය. ඒ ඉල්ලීම්වල 'ගැළපෙන - නොගැළපෙනභාවය' තීරණය කෙරෙන නිර්ණායක තීරණය කරනු ලබන්නේ රට පාලනයෙහි උරුමය සහිත බහුතර ජාතිය වන අප විසිනි. ආචාර්ය ලියනගේ ගේ 'සමාජ ප්‍රජාතන්ත්‍ර මණ්ඩපයට' පෙනෙන ආකාරයට සෙසු වර්ගයාගේ ඉරණම කුමක් විය හැකිද?

**ලේ නොගලන සංඛ්‍යා ලේඛණ**

අපි මේ වියවුල තවදුරටත් නිරාකුල කරගනිමු.

2009 ජනවාරිය වනවිටත් දෙමළ ගරිල්ලන්ගේ පාලනය යටතේ පවතින ප්‍රදේශ තුළ 250,000ක් සිවිල් ජනයා අවතැන්ව සිටින බව මානුෂීය ආධාර සංවිධාන සහ ඒජන්සි ප්‍රවෘත්ති සේවා විසින් වාර්තා කොට තිබිණ. ජනවාරි 28 වෙනිදා කොළඹදී කැඳවන ලද ප්‍රවෘත්ති සාකච්ඡාවක් ඇමතූ ජාතික හෙළ උරුමයේ මාධ්‍ය ලේකම්වරයා, ''මුලතිවුහී කොටු වී සිටින ජනයා කොටි සංවිධානයේ දැනට මියගොස් ඇති 22,000කට ආසන්න සාමාජිකයින්ගේ මහාවිරු පවුල්වල සාමාජිකයින් බවත්, ඔවුන් සිවිල් වැසියන් සැළකිය නොහැකි බව'ත් ප්‍රකාශ කළ බව එදිනම 'ලංකා ඊ නිවුස්' වෙබ් අඩවිය වාර්තා කර තිබිණ. ඒ ප්‍රකාශය කරන ලද්දේ ආණ්ඩුවේ පිළිවෙත් තීරණයෙහිලා ප්‍රායෝගිකව දායකවන එහි ප්‍රධානතම පාර්ශ්වකාර පක්ෂයක් විසිනි. ආණ්ඩුවේ කැබිනට් මණ්ඩල සාමාජිකයින්ගේ සිට ආරක්ෂක අමාත්‍යාංශ උපදේශක තනතුරු දක්වා තීරක ධූරයන් හොබවන පුද්ගලයෝ ඒ පක්ෂයට නායකත්වය සපයති. අන් කාරණා කෙසේ වෙතත්, ජාතීන්ගේ ප්‍රශ්නය පිළිබඳ කාරණාවේදී මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ ආකල්ප සමපාත වන්නේ එහි කොටස්කාර ජාතික හෙළ උරුමයේ මතවාදය සමග මිස ආණ්ඩුවේ නිවට හවුල්කාරයින් වන කොමියුනිස්ට් පක්ෂයේ හෝ ලංකා සම සමාජ පක්ෂයේ ආකල්පයන් (?) සමග නොවේ. ඒ අනුව එකී ප්‍රකාශයන් සහ වන්නියේ අවතැන්ව හිඳින දෙමළ ජනයාගේ ඉරණම අතර ඇති සම්බන්ධය ආචාර්ය ලියනගේ ගේ 'සමාජ ප්‍රජාතන්ත්‍ර මණ්ඩපයට' පෙනෙන්නේ කෙසේද?

වන්නියේ කොටුව සිටින අවතැන් දෙමළ ජනයාට රජයේ පාලන ප්‍රදේශවලට පැමිණීමට රජය විසිනු සපයනු ලැබූ පැය 48ක කාලය පෙබරවාරි 02 වෙනිදා මධ්‍යම රාත්‍රියෙන් නිමා විය. පෙබරවාරි 03 වෙනිදා රජයට සම්බන්ධ ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය විසින් නිකුත් කරන ලද නිවේදනයකට අනුව 'තව දුරටත් රජයේ පාලන ප්‍රදේශවලට නොපැමිණෙන ජනයාගේ ආරක්ෂාව පිළිබඳ වගකීම රජයේ හමුදාවන්ට සහතික කළ නොහැකි බව' ප්‍රකාශ කෙරිණ. පෙබරවාරි 10 වෙනිදා ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය විසින් නිකුත් කරන ලද නිවේදනයකට  අනුව 'පෙබරවාරි 07 වෙනිදා පුදුකුඩියිරිප්පු ප්‍රදේශයට එල්ල කළ හමුදා ෂෙල් ප්‍රහාරයන් හේතුවෙන් 126 දෙනෙකු මරණයට පත්ව තිබිණ. ඉන් 61 දෙනෙක් ප්‍රතිකාර ලබමින් සිටි රෝගීන් ය. අදාළ නිවේදනයට අනුව ප්‍රහාරයෙන් තුවාල ලැබූ සංඛ්‍යාව 238කි. එදිනම සුදන්දිරපුරම් ප්‍රදේශයට එල්ල වූ ෂෙල් ප්‍රහාරයන්ගෙන් 80 දෙනෙකු මිය ගොස් 198 දෙනෙකු තුවාල ලැබ තිබිණ.' *(http://www.amnesty.org/en/news-and-updates/news/more-civilians-killed-sri-lanka-fighting-20090210)* පෙබරවාරි 13 වෙනිදා මුලතිවු ප්‍රදේශයේ සේවයේ නියුතු රජයේ වෛද්‍යවරයෙකුගේ ප්‍රකාශයක් උපුටා දක්වන ඇසෝසියේටඩ් ප්‍රෙස් වාර්තාවකට අනුව දිනකට ෂෙල් හා ගුවන් ප්‍රහාරයන්ට හසුව මිය යන දෙමළ වැසියන්ගේ සංඛ්‍යාව  40කි. *(http://www.thestar.com/News/World/article/587193)*

වර්ග සංහාරය ගැන මා කී 'බොරුව' පිළිබඳ සාක්ෂි අවාසනාවට මෙන් තවදුරටත් දිග්ගැසෙයි.

පෙබරවාරි 17 වෙනිදා දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු කණ්ඩායම් නායක ත්‍රීකුණාමල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ආර්.සම්බන්ධන් විසින් පාර්ලිමේන්තු සංකීර්ණයේදී කැඳ වූ ප්‍රවෘත්ති සාකච්ඡාවක් අමතමින් මෙසේ කීවේයඃ **''මෑත කාලය තුළ ශ්‍රී ලංකා රජයේ සන්නද්ධ හමුදාවන් විසින් එල්ල කරනු ලැබූ නිර්දය ප්‍රහාරයන් හේතුවෙන් වන්නි ප්‍රදේශයේ 2,000කට වැඩි දෙමළ වැසියන් මියගොස් තවත් 4,500ක් පමණ තුවාල ලබා තිබේ. මෙය සැළසුම් සහගත දෙමළ වර්ග සංහාරයක් මිස අන් කිසිත් නොවේ.'** *(http://www.tamilalliance.net/ - 17.02.2009)* සම්බන්ධන් මන්ත්‍රීවරයාගේ ප්‍රකාශය සනාථ කරන තොරතුරු මානව හිමිකම් සංවිධාන වාර්තාවන් ඇසුරින් උපුටා දක්වන 'ඉන්ටර්නැෂනල් හෙරල්ඩ් ට්‍රිබියුන්' පත්‍රයේ පෙබරවාරි 20 වෙනිදා කලාපයේ වාර්තාවකට අනුව දෙමල ගරිල්ලන් සතු භූමිය අල්ලා ගැනීමට රජයේ හමුදාවන් ගෙනයන මෙහෙයුම් හේතුවෙන් සති හයක කාලය තුළ සිවිල් වැසියන් 2,000ක් මියගොස් 5,000කට වැඩි පිරිසක් තුවාල ලබා තිබේ. *(www.iht.com/articles/2009/02/20/asia/lanka.php)* නමුත් සිදුවන සංහාරයේ තරම පිළිබඳ ඒ පැමිණිල්ල කර සිටියේ සම්බන්ධන් මන්ත්‍රීවරයා පමණක් නොවේ. කොටි සංවිධානයේ නායකයාට නිරන්තර ලිපි ලිවීම විනෝදාංශයක් කොටගත්  වීරසිංහම් ආනන්දසංගරී, සිය පුරුද්දෙන් බැහැරව යමින් පෙබරවාරි 19 වෙනිදා ජනාධිපති මහින්ද රාජපක්ෂ වෙත ලිපියක් ලීවේය. ආනන්දසංගරී විසින් අතිශය ගෞරව පුරස්වරව ජනාධිපතිවරයාගේ අවධානයට යොමුකරනු ලබන සංඛ්‍යා ලේඛණයන්ට අනුව පෙබරවාරි දෙවන සතිය තුළදී පමණක් දෙමළ වැසියන් 288ක් මිය ගොස් 766ක් තුවාල ලබා තිබේ. ඔහුට අනුව පෙබරවාරි 14 වෙනි සෙනසුරාදා පමණක් මියගොස් ඇති සාමාන්‍ය වැසියන් සංඛ්‍යාව 55ක් වන අතර තුවාල ලබා ඇති පිරිස 109කි. *(http://anandasangary.com/?p=560)*. අවතැන් සිවිල් වැසියන් අතර ඉහළ යන මරණ සංඛ්‍යාවන් හකුළා දක්වන එම ලිපිය කොටි සංවිධානයේ නායකයාට යවනු වෙනුවට ජනාධිපති මහින්ද රාජපක්ෂට යොමු කරන්නට ආනන්දසංගරී තීරණය කරන්නට ඇත්තේ මක් නිසාදැයි කල්පනා කර බැලීමට ඕනෑ නම් දැන් අවකාශ තිබේ.

අන්‍යෝන්‍ය වශයෙන් පසමිතුරුකම් තිබියදී වුවද ආර්. සම්බන්ධන් සහ ආනන්දසංගරී විසින් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ කරුණු දැක්වීම් සනාථ කරන තොරතුරු කොටි සංවිධානය සම්බන්ධයෙන් උග්‍ර විවේචනාත්මක පිළිවෙතක් දරණ 'හියුමන් රයිට්ස් වොච්' සංවිධානය විසින් හෙළි කරනු ලැබුණේ පෙබරවාරි 24 වෙනිදා ය. එක්සත් ජනපද සෙනෙට් මඩුල්ලේ විදේශ සබඳතා පිළිබඳ කමිටුව හමුවේ ශ්‍රී ලංකාවේ මෑතකාලීන වර්ධනයන් පිළිබඳව අදහස් දැක් වූ 'හියුමන් රයිට්ස් වොච්' සංවිධානයේ  හදිසි

ආපදා අංශයේ ප්‍රධානියාට අනුව දෙසැම්බර් 15 වෙනිදා සිට පෙබරවාරි 10 වෙනිදා දක්වා දෙමසක කාලය තුළ ශ්‍රී ලංකා රජයේ හමුදා වන්නි ප්‍රදේශයේ රෝහල් ඉලක්ක කොට 20 වතාවක් ප්‍රහාර එල්ල කොට තිබේ. *(http://transcurrents.com/tc/2009/02/hrw_calls_for_un_security_coun.html)* නමුත් පෙබරවාරි 02 වෙනිදා 'ස්කයි නිවුස්' සේවාව සමග සම්මුඛ සාකච්ඡාවකට එක් වූ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට අනුව 'රජය විසින් ප්‍රකාශිත ආරක්ෂක කලාපයෙන් බැහැරව පවත්වාගෙන යනු ලබන රෝහලක් වුවද යුද්ධයේදී සුජාත ඉලක්කයක්' සේ සැළකේ.

සම්බන්ධන්ගේ සිට ආනන්දසංගරී හරහා හියුමන් රයිට්ස් වොච් සංවිධානය දක්වා පුළුල් පරාසයක පරස්පර ස්ථාවරයන්හි පිහිටා සිටින පිරිස් හෙළිකරනු ලබන ඉහත සංඛ්‍යා දත්ත තුළ ගැබ් වූ සංහාරක යථාර්ථයන් එතෙකින් නොනවතී. රජයේ පාලන ප්‍රදේශ තුළට පැමිණෙන දෙමළ ජනයා හමුදා රැකවල් යෙදූ සිර කඳවුරු තුළ කොටු කර, විසුරුවන ලන පවුල් තුන් වසරකට නොඅඩු කාලයක් රැඳවුම් ගම්මාන තුළ බලහත්කාරයෙන් රඳවා තබාගැනීමේ සැළසුම් මීට අමතර වශයෙනි. *(සවිස්තරාත්මක තොරතුරු සඳහා බලන්න www.iht.com/articles/ap/2009/02/23/asia/AS-Sri-Lanka-Civilian-Fears.php හෝ www.csmonitor.com/2009/0225/p06s01-wosc.html හෝ www.timesonline.co.uk/tol/news/world/asia/article5721635.ece)* 'රාවය' පුවත්පත විසින්ම පෙබරවාරි 22 වෙනිදා වාර්තා කළ ආකාරයට මෙකී කඳවුරුවාසී ජනයා මුණගැසීමට ජාත්‍යන්තර රතු කුරුස කමිටු සාමාජිකයින්ට තිබූ අවසරය පෙබරවාරි 16 වෙනිදා සිට අවලංගු කොට තිබේ. විසි වසරකට පෙර දකුණේ හමුදා වධ කඳවුරු තුළට පවා යාමට අවසරය ලැබූ රතු කුරුසයට උතුරේ සරණාගත ජනයාගේ 'සුබසෙත' සළකා ඉදිකළ බැව් කියන 'සුබසාධන කඳවුරු' තහනම් බිම් බවට පෙරළීම විසින් පරාවර්ථනය කරන්නේ 'මිලිටරි උපායක්ද? මිලිටරි ගැටළුවක්ද?'

**අධිපතිවාදය සමග එදිරිවාදිකම් අත්හිටුවීම**

'සත්‍යයේ තැන නිහඬතාව විසින් අත් කරගත් විට නිහඬතාව යනු බොරුවකැ'යි සෝවියට් ලේඛක යෙෆ්ටුෂෙන්කෝ වරක් ලීවේය. පලස්තීන ගාසා තීරයේ ඊශ්‍රායෙලය විසින් ගෙනයන යුද ක්‍රියා මාර්ග වර්ග සංහාරයක් සේ සැළකිය නොහැකි යැයි කියා මුනිවත රකිනවුන්ට පිළිතුරු සපයමින් ජනමාධ්‍යකරු ජෝන් පිල්ජර් මෑතදී ලියූ ලිපියක් ආරම්භවන්නේ යෙෆ්ටුෂෙන්කෝගේ ඒ වැකියෙනි. අනතුරුව පිල්ජර් මෙසේ ලියයිඃ ''ගාසා තීරය මත පටවන ලද සාගතයත්, මානුෂීය ආධාර වැළැක්වීමත්, ඖෂධ සහ ප්‍රතිකාර සැපයීම ප්‍රතික්ෂේප කිරීමත්, යටිතල ව්‍යුහයන් සැළසුම් සහගතව විනාශ කිරීමත්, සිවිල් ජනයා ඝාතනය සහ ආබාධිතභාවයට පත් කිරීමත් වර්ග සංහාරය පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය මගින් ස්ථාපිත ප්‍රමිතීන්ට ළඟා වේ.'' *(Holocaust Denied: The lying silence of those who know - John Pilger / www.antiwar.com)* දෙමසක් අතුළතදී පිළිගත් රෝහල් ගොඩනැගිලිවලට විසි වතාවක් පහර දෙමින්, 2,000කට වැඩි දෙමළ ජන පිරිසක් ඝාතනය කොට 5,000කට වැඩි පිරිසකට තුවාල සිදුකරමින්, දහස් සංඛ්‍යාත ජනයා කඳවුරු තුළ සිරගත කරන අපේ යථාර්ථය, ආචාර්ය ලියනගේ විසින් හදාගත් 'සමාජ ප්‍රජාතන්ත්‍ර මණ්ඩපයට' පෙනෙන්නේ කෙසේද?

ඉරාකය තුළ 'ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමේ' ක්‍රියාවලියේ සාර්ථක නිමාව නිවේදනය කිරීමට කැඳවන ලද බුෂ්ගේ අවසන් ප්‍රවෘත්ති සාකච්ඡාවේදී නැගී සිටි මුන්ටාඩාර් අල් සයීඩි සිය සපත්තු යුගළ ගළවා බුෂ්ගේ උත්කර්ෂයට පහර දුන්නේය. ඇතැමුන්ට අන්තවාදයක් සේ හැඟෙන්නට ඉඩක් තිබුණද ලංකාවේ පශ්චාත් යුද ගැටුම් සාකච්ඡා සභාව ඉදිරියේ මා අනුගමනය කරන්නේ අල් සයීඩිගේ පිළිවෙතයි. 'වර්ග සංහාරය' ගැන මා ලියූ '**කතාවෙහි**' සත්‍යයක් ඇතැයි ආචාර්ය සුමනසිරි ලියනගේට නොපෙනෙන්නේ, ඉහත සැකෙවින් ලියන ලද ඒ සංහාරයේ වග විස්තරය ඔහු නොදන්නා නිසා නොවේ. ඒ '**කතාවෙහි සත්‍යයක් පෙණුනහොත්**' පශ්චාත් යුද ගැටුම් පිළිබඳ සන්සුන් සාකච්ඡා මණ්ඩපවල ශාස්ත්‍රාලයීය සුරතාන්තය එතැනින් අවසන් වන බැවිනි. *'The lying silence of those who know'* යනුවෙන් පිල්ජර් ලියන්නේ ඒ ගැන ය. කයෝර ඇත්ත මෙයයිඃ දක්ෂිණාංශික ඩයිනසෝරයන් ගහණ සංත්‍රාස උයනක් බවට පෙරළුණු වත්මන් ශ්‍රී ලංකාවේ 'පශ්චාත් යුද සාකච්ඡාවන්' වූ කලී නැග එන වර්ග නාශක අධිපතිවාදය සමග ලිබරල් සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී බුද්ධිමතුන් ඇති කොටගත් එදිරිවාදිකම් අත්හිටුවීමේ සම්මුතියයි. ඒ අධිපතිවාදයට බයාදුව හිස පහත් නොකරන අවසාන දෙමළාගේද රුධිරය ගලා බසින්නට නියමිතව ඇත්තේ 'පශ්චාත් යුද ගැටුම් තේමා' ගැන ගාම්භීර විවාදයන්හී ගැළුණු මේ සන්සුන් 'ලතා මණ්ඩප' පා මුලිනි.

**රෝහිත භාෂණ අබේවර්ධන**

*රාවය / 2009 මාර්තු 15*